වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# පොල් වගාකිරීමේ මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

**පොල් වගාකිරීමේ මණ්ඩලය පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**තනතුර : කළමනාකරු (ණය හා සංවර්ධන)**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය/ කළමනාකරණ උපාධිය ලබා තිබීම

**සහ**

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03)ක සේවා පළපුරුද්ද.

**වැටුප් කාණ්ඩය** : MM 1-1

**වැටුප් පරිමාණය** : රු.91,690/-(2,480X10)(3,450X15) 168,240/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 81,710/- | රු. 91,690/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුර : ප්‍රාදේශීය කළමනාකරු**
**සේවා ස්ථානය : සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය/ කෘෂිකර්ම උපාධිය

**සහ**

උපාධිය ලබාගැනීමෙන් පසු අදාළ විෂය ක්ෂේත්‍රයේ වසර තුන (03)ක සේවා පළපුරුද්ද.

**වැටුප් කාණ්ඩය** : MM 1-1

**වැටුප් පරිමාණය** : රු.91,690/-(2,480X10)(3,450X15) 168,240/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 81,710/- | රු. 91,690/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : ගොවිපළ සැලසුම් නිලධාරි**
**සේවා ස්ථානය : සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් විද්‍යාවේදී කෘෂිකර්ම විශේෂ උපාධිය/ කෘෂිකර්ම ව්‍යාප්ති විෂය හා භෝග විද්‍යාව විෂය සහිතව ලබාගත් විද්‍යාවේදී උපාධිය

**සමඟ**

රාජ්‍ය/ මණ්ඩල/ සංස්ථා හෝ පිලිගත් පෞද්ගලික ආයතනයක ණය/ ව්‍යාප්ති හා සංවර්ධන කටයුතු පිලිබඳ වසරක සේවා පළපුරුද්දක් ලබා තිබීම හා පිලිගත් ආයතනයක පරිගණක සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

**වැටුප් කාණ්ඩය** : JM 1-2

**වැටුප් පරිමාණය** : රු.74,010/-(1,360X10) (2,040X18) 124,330/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 66,781/- | රු. 74,010/- |

වයස : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : ගිණුම් නිලධාරි**
**සේවා ස්ථානය : සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

ගණකාධිකරණ විෂය සහිතව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් උපාධියක්/ පිලිගත් වරලත් වෘත්තීය ගණකාධිකාරි ආයතනයක මධ්‍යම පරීක්ෂණය සමත් වීම/ ගණකාධිකරණය පිලිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම

සමග

රාජ්‍ය/ සංස්ථා හෝ රජය පිලිගත් ආයතනයක ගිණුම් කටයුතු පිලිබඳ වසරක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** : JM 1-2

**වැටුප් පරිමාණය** : රු.74,010/-(1,360X10) (2,040X18) 124,330/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 66,781/- | රු. 74,010/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**තනතුර : අභ්‍යන්තර විගණන නිලධාරි**
**සේවා ස්ථානය : ප්‍රධාන කාර්යාලය**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

මූල්‍ය පාලන විෂයක් සහිත ව්‍යාපාර කළමනාකරණය පිලිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිලිගත් උපාධියක්/ වාණිජවේදී උපාධිය හෝ පිලිගත් වරලත් වෘත්තීය ගණකාධිකාරි ආයතනයක මධ්‍යම පරීක්ෂණය සමත්වීම / ගණකාධිකරණය පිලිබඳ උසස් තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව සමත්වීම

**සහ**

රාජ්‍ය / සංස්ථා හෝ රජය පිලිගත් ආයතනයක ගිණුම් හා විගණන කටයුතු පිලිබඳ වසරක සේවා පළපුරුද්ද

**වැටුප් කාණ්ඩය** : JM 1-2

**වැටුප් පරිමාණය** : රු.74,010/-(1,360X10) (2,040X18) 124,330/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 66,781/- | රු. 74,010/- |

**වයස** : අවු. 22 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : පොල් සංවර්ධන නිලධාරි**
**සේවා ස්ථානය : සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගත් කාර්මික/ වෘත්තීය ආයතනයකින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (05) මට්ටම හෝ ඊට ඉහළ මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සටහන**

සම්මුඛ පරීක්ෂණයේදී ලබාඇති ප්‍රවීණතා සහතිකයේ මට්ටම හා වෘත්තීය සුදුසුකම් අනුව ලකුණු හිමිවේ.

**වැටුප් කාණ්ඩය** : MA 2-3

**වැටුප් පරිමාණය** : රු.52,700/-(800X10)(1,190X11)(1,320X10) (1,350X10) 100,490/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 48,784/- | රු. 52,700/- |

**වයස** : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

**තනතුර : නේවාසික තවාන්භාර නිලධාරි III ශ්‍රේණිය**
**සේවා ස්ථානය : සේවා අවශ්‍යතාවය අනුව දිවයින පුරා**

**සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර සුදුසුකම් -**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිලිගත් කාර්මික / වෘත්තීය ආයතනයකින් කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (N.V.Q) පහ (05) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වැටුප් කාණ්ඩය** : MA 2-3

**වැටුප් පරිමාණය** : රු.52,700/ - (800X10) (1,190X11) (1,320X10) (1,350X10) 100,490/-

01/2025 චක්‍රලේඛ ප්‍රකාරව වැටුප් ගෙවීම් කරන ආකාරය

| 2026.01.01 දිනට | 2027.01.01 දිනට |
|---|---|
| රු. 48,784/- | රු. 52,700/- |

**වයස** : අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ

(උක්ත තනතුරු සඳහා ජීවන වියදම් දීමනාව රු.17,800/- ඇතුළු තනතුරට අදාළ රජයේ අනෙකුත් දීමනා හිමි වේ.)

**වෙනත් කොන්දේසි :-**

බඳවාගැනීමේ ක්‍රමවේදය - පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලබන පරිදි ඉල්ලුම්පත් කැඳවීමෙන් පසුව ලිඛිත තරග විභාගයක හා / හෝ පත්වීම් බලධාරයා විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මගින් පැවැත්වෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

සෑම ඉල්ලුම්කරුවෙක් ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම්පත් :**

- ඒ අනුව 2026.09.07 දිනට අදාළ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පහත වෙබ් අඩවියේ ඇති ආදර්ශ ආකෘතියට අනුව හෝ තමන් විසින් සකස් කර ගත් සුදුසු ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමු කළ යුතු වේ. එමෙන්ම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිලිබඳ විස්තර සනාථ කළ හැකි සහතිකවල සහතික කළ පිටපත් සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එසේ යොමු නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද දැනටමත් රජයේ/ සංස්ථා/ මණ්ඩලවල සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.
- අයදුම්පත් බහා එවන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය. එසේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- තනතුරු කිහිපයකට ඉල්ලුම් කරන්නේනම් එක තනතුරකට එක බැගින් වන සේ අයදුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු වේ.
- එමෙන්ම මෙම සම්මුඛ පරීක්ෂණ සම්බන්ධයෙන් ඔබ විසින් යම් බලපෑමක් සිදුකරනු ලැබුවහොත් එය තනතුරට බඳවා ගැනීමේ නුසුදුසුකමක් සේ සලකනු ලබන බවද වැඩි දුරටත් දන්වා සිටිමි.
- සියලුම අයදුම්පත් **2026.09.07** දින හෝ එදිනට පෙර ලැබෙන සේ **"සභාපති, පොල් වගාකිරීමේ මණ්ඩලය, 9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අදාළ බඳවා ගැනීමේ බලධාරියා විසින් තීරණය කරනු ඇත. මෙම තනතුර සම්බන්ධයෙන් කරනු ලබන පෞද්ගලික විමසීම් ඒ සඳහා නුසුදුසුකමක් සේ සලකා කටයුතු කරනු ලැබේ.

**සභාපති,**
**පොල් වගාකිරීමේ මණ්ඩලය,**
**9/428, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

ඉහත තනතුරු සඳහා අදාළ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවියෙන් බාගත කර ගන්නා ලෙස දන්වමි. එසේම එසේ බාගත කර ගැනීමේ යම් අපහසුතාවයක් ඇති වුවහොත් තමන් විසින් සකස් කර ගත් ආකෘතියක් භාවිතා කර අයදුම්පත් යොමු කරන ලෙස දන්වමි.

https://coconutsrilanka.lk/